**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

# අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා පහත දැක්වෙන සුදුසුකම් සහිත විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

භූ විද්‍යාඥයකු හෝ පතල් ඉංජිනේරුවරයෙකු වශයෙන් යටත් පිරිසෙයින් වසර දොළහක (12) ඔප්පුකරන ලද වෘත්තීය සහ ව්‍යවහාරික පළපුරුද්ද සමඟ ඒ පිළිබඳව පශ්චාත් උපාධියක් හෝ අධිකාර පත්‍රයක් දරනු ලැබිය යුතුය.

**වැටුප් පරිමාණය - රු. 91,645 - 2700×12 – රු. 124,045/- (HM 2-1-2016)**

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016(I) අනුව 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන වැටුප් තලය මෙය වන අතර ඒ අනුව 2017.01.01 දින සිට අදාළ වර්ෂයට හිමි වැටුප වන්නේ රු. 63,076/- කි.)

**වයස් සීමාව**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි අය විය යුතුය. රාජ්‍ය හා සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිළධාරින්ට මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

**තනතුරට අදාළ පොදු කොන්දේසි**

1. 2009 අංක 66 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධිත) පනතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරිම සම්බන්ධව පනවා ඇති විධිවිධාන බලපැවැත්වේ.
2. තෝරාගනු ලබන අයදුම්කරු සිය මූලික වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට බැර කල යුතු වේ. කාර්යාංශය විසින් 12% ක් සේවක අර්ථසාධක අරමුදලට හා 3% සේවක භාරකාර අරමුදලටද දායක වනු ඇත.
3. ඉහත වැටුපට අමතරව කාර්යාංශයෙහි ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයට හිමි වෛද්‍ය හා අනෙකුත් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**පොදු උපදෙස්**

- රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්ව විද්‍යාල හා පෞද්ගලික අංශයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ස්වකීය අදාල ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කල යුතුය.
- අයදුම්කරුවන්ගේ සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවන් සහ අදාල සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා තිබිය යුතු අතර, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ලිපිනයන් හා දුරකථන අංකයන් සඳහන් කර තිබිය යුතුය.
- කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි **"භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර"** යන්න සඳහන් කොට පහත ලිපිනයට **03.05.2017** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්,**
**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,**
**අංක 82, සම්පත්පාය**
**රජමල්වත්ත පාර,**
**බත්තරමුල්ල.**